Annex I

# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE


මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01. இலங்கை | The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No. TIP/SS/01/03
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2016.07. 14

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක : 01/2016

ජනාධිපති ලේකම්
අග්‍රාමාත්‍ය ලේකම්
අමාත්‍ය මණ්ඩල ලේකම්
කොමිෂන් සභා ලේකම්වරුන්
අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත
රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්

<u>සහනදායී පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබා දීමේ යෝජනා ක්‍රමය</u>

සහනදායි පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබාදීමට අදාල සියළු යෝජනා ක්‍රම 2015.11.20 දින ඉදිරිපත් කරන ලද අයවැය යෝජනා අනුව අවලංගු කරනු ලැබීය. අනතුරුව මුදල් අමාත්‍යතුමා විසින් ඉහත කරුණ යටතේ ඉදිරිපත් කරන ලද 2016.03.26 දිනැති අංක MFs/PA/CP/16/47 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සම්බන්ධයෙන් 2016.05.24 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදි ගනු ලැබූ තීරණය ප්‍රකාරව මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

ඒ අනුව රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනයන්හි සේවය කරනු ලබන ජ්‍යෙෂ්ඨ විධායක මට්ටමේ පරිපාලන, කළමනාකරණ සහ වෘත්තියමය තනතුරුවල නිරත වන නිලධාරීන් සඳහා සහනදායි පදනම මත මෝටර් රථ ආනයනය කිරීම සඳහා සහ දේශීයව නිෂ්පාදනය කරන ලද මෝටර් රථ මිලදී ගැනීම සඳහා අදාල වන විධිවිධාන මෙයින් පනවනු ලැබේ. මෙම බලපත්‍රය සහ එයට අදාල පහසුකම් කිසිදු ආකාරයකින් අයිතිවාසිකමක් ලෙස නොසැලකිය යුතු අතර රජය විසින් වරින් වර ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට මෙම චක්‍රලේඛය යටත්වේ.

## 01. හිමිකම් ලබන අවස්ථා

පහත සඳහන් කුමන තනතුරක හෝ තනතුරු කිහිපයක හෝ නියමිත සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා එම තනතුරු වල ස්ථිර සේවා කාලයක් ඇති නිලධාරීන් හට මෙම බලපත්‍රය හිමි වේ.

1.1 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හි සඳහන් "ජ්‍යෙෂ්ඨ මට්ටම" ට අයත් විධායක තනතුරක වසර හයක (06) සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා තනතුරෙහි ස්ථිර කර ඇති රාජ්‍ය නිලධාරීන්.

1.2 ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ "ජ්‍යෙෂ්ඨ මට්ටම" ට අයත් විධායක තනතුරක වසර හයක (06) සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා තනතුරෙහි ස්ථිර කර ඇති නිලධාරීන්.

1.3 අමාත්‍ය මණ්ඩල තීරණයකින් රාජ්‍ය ආයතනයන්හි (රජයේ සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතන හැර) "ජ්‍යෙෂ්ඨ මට්ටම" ට අයත් විධායක තනතුරකට පත්කර ඇති වසර හයක (06) සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා තනතුරෙහි ස්ථිර කර ඇති නිලධාරීන්.

1.4 වසර හයක (06) සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා තනතුරෙහි ස්ථිර කර ඇති ත්‍රිවිධ හමුදාවන්හි ලුතිනන් කර්නල්, වින්ග් කමාන්ඩර්, කමාන්ඩර් සහ ඊට ඉහල නිලධාරීන්.

1.5 වසර හයක (06) සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා තනතුරෙහි ස්ථිර කර ඇති ත්‍රිවිධ හමුදාවන්හි වෛද්‍යවරුන්, ඉංජිනේරුවන්, ගණකාධිකාරීවරුන්, වාස්තු විද්‍යාඥයින් හා නීතිඥ වරුන් ලෙස සේවය කරනු ලබන නිලධාරීන් (හමුදා නිලය නොසලකා).

1.6 අමාත්‍ය මණ්ඩල තීරණයකින් රාජ්‍ය සංස්ථා හෝ ව්‍යවස්ථාපිත ආයතනයකට පත් කරනු ලැබූ "ජ්‍යෙෂ්ඨ මට්ටම" ට අයත් විධායක තනතුරකට පත්කර ඇති වසර දොලහක (12) සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා තනතුරෙහි ස්ථිර කර ඇති නිලධාරීන්.

1.7 රජයේ විශ්වවිද්‍යාල වල අධ්‍යයන කාර්ය මණ්ඩලවල "ජ්‍යෙෂ්ඨ මට්ටම" ට අයත් තනතුරක හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවල "ජ්‍යෙෂ්ඨ මට්ටම" ට අයත් විධායක තනතුරක වසර අටක (08) ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා තනතුරෙහි ස්ථිර කර ඇති නිලධාරීන්.

1.8 වසර දොලහක (12) සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා තනතුරෙහි ස්ථිර කර ඇති ශ්‍රී ලංකා මහ බැංකුවේ "ජ්‍යෙෂ්ඨ මට්ටම" ට අයත් විධායක නිලධාරීන්.

1.9 කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත සේවක සංඛ්‍යාව තුල ඇතුලත් සුදුසුකම් ලබන තනතුරක;

i. වසර දොලහක (12) සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා තනතුරෙහි ස්ථිර කර ඇති රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනයන්හි "ජ්‍යෙෂ්ඨ මට්ටම" ට අයත් විධායක තනතුරක නිලධාරීන් සහ

ii. වසර නවයක (09) සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා තනතුරෙහි ස්ථිර කර ඇති රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනයන්හි "ජ්‍යෙෂ්ඨ මට්ටම" ට අයත් විධායක තනතුරක සේවය කරනු ලබන වරලත් ඉංජිනේරුවන්, වරලත් ගණකාධිකාරීවරුන් හා වරලත් වාස්තු විද්‍යාඥයින්.

1.10 විශ්වවිද්‍යාල කුලපති වරුන්.

1.11 "ලියාපදිංචි වෛද්‍ය නිලධාරී" තනතුරක පළමුවන ශ්‍රේණියේ වසර හයක (06) ක සක්‍රීය සේවා කාලයක් සහිත තනතුරේ ස්ථිර කර ඇති "ලියාපදිංචි වෛද්‍ය නිලධාරීන්".

1.12 වසර නවයක (09) සක්‍රීය සේවා කාලයක් හිමි රජයේ සංවර්ධන ව්‍යාපෘතියක හෝ ව්‍යාපෘති කිහිපයක (කොන්ත්‍රාත් පදනමින් හෝ) සේවය කරන ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන්, වරලත් ඉංජිනේරුවන්, වරලත් ගණකාධිකාරීවරුන්, වරලත් වාස්තු විද්‍යාඥයින් හා නීතිඥවරුන්.

1.13 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සලසා ඇති විධිවිධාන ප්‍රකාරව පිහිටුවා ඇති කොමිෂන් සභාවක වසර තුනක (3) සක්‍රීය සේවා කාලයක් සහිත කොමිෂන් සභා සභාපතිවරුන් හා සාමාජිකයින්.

## 02. හිමිකම් නොලබන අවස්ථා

මෙම චක්‍රලේඛය මඟින් පහත සඳහන් නිලධාරී කාණ්ඩයන් ආවරණය නොවේ.

2.1 මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වන දිනය වන විටත් කුමන හෝ සහනදායී මෝටර් රථ බලපත්‍ර යෝජනා ක්‍රමයක් යටතේ දෙවරකදී හෝ ඊට වැඩි වාර ගණනකදී හෝ වාහන ලබා ගෙන ඇති නිලධාරීන්.

2.2 වැටුප් රහිත නිවාඩු මත (මෙහි 3.4 වගන්තියට යටත්ව) නිදහස් කර ඇති නිලධාරීන්.

2.3 සුදුසුකම් ලබන තනතුරකට පෞද්ගලික වන සේ හෝ අධි සේවක පදනම මත හෝ පත්කර ඇති නිලධාරීන්.

2.4 රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලබා ගත් හෝ ඉවත් වූ පසුව සුදුසුකම් ලබන තනතුරකට කොන්ත්‍රාත් පදනම මත පත්කර ඇති නිලධාරීන් (ඉහත 1.12 වගන්තිය යටතට ගැනෙන නිලධාරීන් හැර).

2.5 ආයතන සංග්‍රහයේ විධිවිධානයන් අනුව හෝ ඒ ඒ ආයතනයන්හි භාවිතයට ගනු ලබන පාලන විධිවිධාන හෝ නීති රීති අනුව මූලික විමර්ශනයක් හෝ විධිමත් විනය පරීක්ෂණයක් ආරම්භ කර දැනට එම ක්‍රියාමාර්ගය අවසන් කර නොමැති නිලධාරීන්.

2.6 මෙයට පෙර කුමන හෝ සහනදායී මෝටර් රථ බලපත්‍ර යෝජනා ක්‍රමයක් යටතේ මෝටර් රථයක් ලබාගෙන ඇත්නම් එය ලියාපදිංචි කල දින සිට වසර දහය (10) ක් ඉක්මවා නොමැති නිලධාරීන්.

2.7 කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත තනතුරු සංඛ්‍යාවෙන් බැහැරව ආයතනය විසින් ඇති කරන ලද තනතුරක සේවය කරනු ලබන නිලධාරීන්.

## 03. කොන්දේසි, නියමයන් සහ සහන

3.1 මෙම යෝජනා ක්‍රමය යටතේ වාහන ලබා ගැනීම සඳහා හිමිකම් ලබනුයේ තම සේවා කාලය තුල උපරිම වශයෙන් දෙවරක් පමණකි.

3.2 සහනදායී යෝජනා ක්‍රමයක් යටතේ මීට පෙර ලබා ගත් බලපත්‍රයක් භාවිත කර නොමැති අවස්ථාවලදී ඒ බවට බලපත්‍ර ලාභියා විසින් සනාථ කල යුතුය. එසේ සනාථ කිරීමට නොහැකි වන අවස්ථාවන්හිදී එම බලපත්‍රය භාවිත කලා සේ සලකනු ලැබේ.

3.3 මෙම චක්‍රලේඛය අනුව ඉහත "1.1" සිට "1.9" දක්වා වන කාණ්ඩයන් යටතේ සුදුසුකම් ලබන තනතුරු කිහිපයක සේවා කාලයන් එකතු කර අදාල බලපත්‍රය සඳහා සේවා කාලය ගණනය කල හැකි අතර එවැනි ඉල්ලීම් අදාල ලේකම්වරයාගේ ද නිර්දේශය සමඟ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත යොමු කල යුතු අතර අවශ්‍යතාවය අනුව තීරණයක් ලබා දීම හෝ අවශ්‍ය නම් මෙහි 5.1 වගන්තියේ ප්‍රතිපාදන අනුව කටයුතු කිරීම හෝ කරනු ඇත.

3.4 මෙම චක්‍රලේඛයෙහි සක්‍රීය සේවා කාලය යන්නෙන් අදහස් කරනුයේ සුදුසුකම් ලබන තනතුරක් සඳහා නිලධාරියාගේ සේවා කාලය ගණනයේදී වැඩ තහනමකට ලක් වීම මත, අඩ වැටුපකට හෝ වැටුප් රහිත නිවාඩු ලබා ගැනීම මත හෝ වෙනත් කුමන හෝ හේතුවක් මත පත්වීම පෙරදාතම් කිරීම මත වූ කාලයන් අතහැර ගණනය කරනු ලබන සේවා කාලය වේ.

එසේ වුවද රජයේ, රාජ්‍ය සංස්ථා හෝ ව්‍යවස්ථාපිත ආයතනයන්හි සේවය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත වැටුප් රහිතව තාවකාලිකව මුදා හැර ඇති රජයේ, රාජ්‍ය සංස්ථා හෝ ව්‍යවස්ථාපිත ආයතනයක නිලධාරීන්ගේ එකී වැටුප් රහිත සේවා කාලය ද සක්‍රීය

සේවා කාලය යන්නට අයත් වේ. පශ්චාත් අධ්‍යයන කටයුතු සඳහා වන වැටුප් රහිත නිවාඩු, විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ සප්ත වාර්ෂික නිවාඩු, අඩ වැටුප් හා වැටුප් රහිත නිවාඩු ඇතුළුව ප්‍රසූත නිවාඩු සක්‍රිය සේවා කාලය ලෙස මෙම චක්‍රලේඛයේ අවශ්‍යතා සඳහා ගණනය කල යුතුය.

3.5 පෙරදාතම් කරන ලද කාලය සහනදායී මෝටර් රථ බලපත්‍ර ලබා දීම සඳහා සක්‍රිය සේවා කාලය ලෙස ගණනය කරනු නොලැබුවද යම් නිලධාරියෙකුගේ පෙරදාතම් කාලය තුල ඔහු හෝ ඇය හට සුදුසුකම් ලබන තනතුරක වැඩ බැලීම සඳහා විධිමත් පරිදි පත්වීම් ලබා දී ඒ අනුව සේවය කර ඇත්නම් පමණක් (පත්වීම් බලධාරියා විසින් නිකුත් කරනු ලබන විධිමත් පත්වීම් ලිපියක් මගින්) එවිට එකී කාලය යථෝක්ත වරප්‍රසාදය සඳහා ගණනය කල හැකිය.

3.6 අධි සේවක පදනම මත හෝ තනතුර දරන්නාට පෞද්ගලික වන සේ හෝ තනතුරු ලබා දී ඇති නිලධාරීන්ගේ තනතුරු වලින් අධි සේවක පදනම හෝ පෞද්ගලික වන සේ යන්න ඉවත් කරනු ලැබූ අවස්ථාවකදී අදාල පදනම ඉවත් කිරීමට තීරණය ගනු ලැබූ දිනය නොව, එකී තීරණය ක්‍රියාත්මක වන දිනය (සාමාන්‍ය සේවක පදනමට පත් වන දිනය) පදනම් කර ගෙන බලපත්‍රය සඳහා වන සේවා කාලය ගණනය කල යුතුය. කෙසේ වුවද මෙම කාලය අදාල කරගත යුත්තේ බලපත්‍රය සඳහා සුදුසුකම් ලබන තනතුරක සේවා කාලය ගණනය කිරීමට පමණි. අදාල කාලය තුල බලපත්‍ර ලාභියා බලපත්‍ර කිහිපයකට සුදුසුකම් ලැබියහැකි වුවද නිකුත් කල යුත්තේ අධි සේවක පදනම ඉවත් කිරීමේ තීරණය ගනු ලබන දිනය වන විට වලංගුව පවතින චක්‍රලේඛය යටතේ එක් බලපත්‍රයක් පමණි.

3.7 ඉහත 3.6 පරිදි "පෞද්ගලික වන සේ" හෝ "අධි සේවක පදනම මත" යන්න ඉවත් කරන විට අදාල බලපත්‍ර ලාභියා විශ්‍රාම ලබා තිබුණද ඔහු විශ්‍රාම ලබන දිනය වන විට මෙම චක්‍රලේඛය පරිදි සුදුසුකම් ලබා ඇත්නම් සහ මෙම චක්‍රලේඛය ක්‍රියාත්මකව පවතීනම් පමණක් එම සහනය ලබා ගත හැක. එවැනි අවස්ථාවකදී ඔහු අවසන් වරට සේවය කරන ලද අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් එම බලපත්‍රය නිකුත් කල යුතුය.

3.8 මෙම චක්‍රලේඛය යටතේ

i. සුදුසුකම් ලබන අයෙකු මිය ගියහොත් හිමිවිය යුතු බලපත්‍රය කලත්‍රයා හෝ කලත්‍රයෙකු නොමැති අවස්ථාවකදී නීත්‍යානුකූල උරුමකරු හෝ උරුමකරුවන් විසින් කරනු ලබන ඉල්ලීමක් සහ අයදුම් පත්‍රයක් මත ලබා ගත හැකිය. කෙසේ වුවද උරුමකරුවන් කිහිපදෙනෙකු සිටින විට මේ සඳහා ඉඩකඩ ලැබෙනුයේ සියළු නීත්‍යානුකූල උරුමකරුවන්ගේ කැමැත්ත හිමි වන නීත්‍යානුකූල උරුමකරුට පමණි.

ii. බලපත්‍රයක් ලබාගෙන ඒ යටතේ වාහනයක් ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කර තිබියදී හෝ එලෙස ලබා ගෙන වසර 05 ක් ගත වීමට මත්තෙන් හෝ බලපත්‍රලාභියා මිය ගියහොත් එම බලපත්‍රයේ හෝ මෝටර් රථයේ හෝ නීත්‍යානුකූල හිමිකම කලත්‍රයාට ලබා ගත හැක. කලත්‍රයෙකු නොමැති අවස්ථාවකදී නීත්‍යානුකූල උරුමකරුට මෙම සහනය ලබාගත හැකිය. නීත්‍යානුකූල උරුමකරුවන් කිහිපදෙනෙකු සිටින විට සියළු නීත්‍යානුකූල උරුමකරුවන්ගේ කැමැත්ත හිමි වන නීත්‍යානුකූල උරුමකරුට පමණක් මෙම සහනය හිමි වේ.

3.9 යම් නිලධාරියෙකුට විරුද්ධ විනය ක්‍රියාමාර්ගයක තීරණය ප්‍රකාශයට පත් වීමට පෙර එකී නිලධාරියා විශ්‍රාම ලැබූවද එම තීරණය ප්‍රකාර සියළු චෝදනාවන්ගෙන් නිදහස් වන අවස්ථාවකදී හිමි වන සහනය පවතින චක්‍රලේඛ විධිවිධාන යටතේ ලබා ගත හැක.

3.10 මෙම යෝජනා ක්‍රමය යටතේ

i. සාමාන්‍යයෙන් මෙරටට ආනයනය කල හැකි වයස් සීමාව ඇතුලත වන සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ (H.S. Headings) 87.03 හෝ 87.04 ට අයත් වන මෝටර් රථ හෝ ඩබල් කැබ් රථ (Double Cab) හෝ යන වාහන වර්ගයකින් ඕනෑම වාහනයක් ලබා ගැනීමට හැකියාව පවතී.

ii. ලබා ගත හැකි වාහනයක උපරිම මී.ර.ගැ. වටිනාකම ඇ.එ.ජ.ඩොලර් 30,000 කි. අනෙකුත් ඕනෑම මුදල් ඒකකයකින් ණයවර ලිපි විවෘත කරන්නේ නම් එහි වටිනාකම අදාල ණයවර ලිපිය විවෘත කරන දිනට පැවති විනිමය අනුපාතය අනුව ඇ.එ.ජ.ඩොලර් 30,000 සීමාව නොඉක්මවිය යුතුය. ණයවර ලිපි විවෘත කරන අවස්ථාවේදී, මෙකී සීමාව ඉක්මවා ඇති වාහන සඳහා කිසිදු බදු සහනයක් හිමි නොවන අතර ඒවා සාමාන්‍ය ආනයන (බදු සහන රහිත) සේ සලකා සම්පූර්ණ බදු හා ගාස්තු ශ්‍රී ලංකා රේගුව විසින් අය කෙරේ. ණයවර ලිපි විවෘත කිරීමේදී බලපත්‍ර ලාභියා මෙම අවදානම පිළිබඳව සැලකිය යුතුය.

iii. බලපත්‍රය උපයෝගී කර ගෙන ලබා ගන්නා මෝටර් රථයක් සඳහා බලපත්‍රලාභියා විසින් ගෙවිය යුතු මුළු නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු මුදලින් 50% ක බදු සහනයක් හිමිවේ. වාහනය රේගුවෙන් නිදහස් කරනු ලබන අවස්ථාවේදී බදු සහනය ගණනය කරනු ලබන්නේ අදාල රේගු සටහන්කරය (CUS DEC) ඉදිරිපත් කරනු ලබන අවස්ථාවේ පවත්නා බදු අනුපාතයන් සහ වාහනයේ වටිනාකම අනුවය.

iv. ලබා ගන්නා ලද මෝටර් රථ හදිසි අනතුරකට ලක් වීම මත නැවත ප්‍රයෝජනයට ගත නොහැකි වන පරිදි හානියට පත් වූ අවස්ථාවකදී එහි සුන්බුන් අයිතිය අදාල රක්ෂණ සමාගම වෙත පැවරීමට හා හානිය පූර්ණය කර ගැනීමට බලපත්‍ර ලාභියාට හැකියාව ඇත. එවැනි අවස්ථාවකදී වාහනයේ ලියාපදිංචි සහතිකය අවලංගු කල යුතු අතර ඒ වෙනුවට බලපත්‍රලාභියා වෙත නව බලපත්‍රයක් නිකුත් කරනු නොලැබේ.

v. ලබා ගනු ලබන මෝටර් රථය එම බලපත්‍රය හිමි නිලධාරියා නමින් ලියාපදිංචි කල යුතු අතර කිසිදු හේතුවක් මත (3.8 (i, ii) සහ 3.10 (iv) වගන්තීන්හි දැක්වෙන අවශ්‍යතාවයන් හැර) ප්‍රථම ලියාපදිංචි දිනයේ සිට වසර පහක් (05) ගතවන තුරු ලියාපදිංචිය මාරු කල නොහැක. කෙසේවුවද 2015.11.20 දින දක්වා ක්‍රියාත්මකව තිබූ 1/2013 චක්‍රලේඛයෙහි විධිවිධාන අනුව ලබා ගත් වාහන පැවරීම සම්බන්ධයෙන් 2014.03.25 දිනැති 01/(02)/2013 චක්‍රලේඛයේ කොන්දේසි ඉදිරියටත් අදාල කර ගත යුතුය.

vi. බලපත්‍රයක් ලබා ගැනීම සඳහා නිලධාරියා සුදුසුකම් ලබන බව තහවුරු කිරීම පිණිස ඔහු විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු සාවද්‍ය යයි තහවුරු වුවහොත් නිකුත් කරන ලද බලපත්‍රය අවලංගු කරනු ලැබේ. එවැනි අවස්ථාවකදී වාහනයක් ලබා ගෙන ඇත්නම් ඒ සම්බන්ධයෙන් අදාල වන නීති යටතේ කටයුතු කරනු ඇත. එසේම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් නීතිමය අයුරින් සහ විනයානුකූලවද කටයුතු කරනු ඇත.

vii. නිකුත් කරනු ලබන බලපත්‍රය ඒ යටතේ වාහනයක් ලබා ගන්නා තුරු වලංගු වේ. කෙසේ වුවද කලින් කලට රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කිරීම මගින් වාහනයක් ලබා නොගෙන බලපත්‍රය ලඟ තබා ගෙන සිටීම මත සිදු වන හානි හෝ අලාභයන් පිළිබඳව වග කියනු නොලැබේ.

viii. ලබා ගත් බලපත්‍රය හෝ එහි බැංකු පිටපත හෝ අස්ථාන ගත වුවහොත් බලපත්‍ර ලාභියා විසින් වහාම පොලීසියට පැමිණිලි කල යුතුය. අනතුරුව එම පැමිණිල්ලේ පිටපතක් සහිතව එම බලපත්‍රය අවලංගු කරන ලෙස ඉල්ලීමක් බලපත්‍රය නිකුත් කරන ලද ලේකම්වරයා වෙත ලබා දිය යුතුය. එවැනි ඉල්ලීමක් ලද වහාම අදාල බලධාරියා විසින් අස්ථානගත වූ බලපත්‍රය අවලංගු කර ඒ පිළිබඳව රේගු අධ්‍යක්ෂ ජනරාල් හා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් දැනුවත් කල යුතුය. ඒ වන විට අදාල බලපත්‍රය භාවිත කර නොමැති බවට ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවෙන් ලිඛිත තහවුරු කිරීමක් ලබා ගෙන මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වන්නේ නම් පමණක් නැවත නියමිත ආකාරයට අයදුම් පත්‍රයක් ලබා ගැනීම මගින් එම නිලධාරියාට බලපත්‍රයක් නිකුත් කිරීමට බාධාවක් නොමැත.

ix. මෝටර් රථයක් ආනයනය කිරීම සඳහා හෝ දේශීය වශයෙන් නිෂ්පාදනය කරනු ලබන වාහනයක් මිලදී ගැනීම සඳහා බලපත්‍ර ලාභියාගේ නමින්ම විධිමත් අයුරින් ණයවර ලිපියක් විවෘත කිරීම හෝ දේශීයව නිෂ්පාදනය කරනු ලබන ආයතනයකට විධිමත්ව ගෙවීම් සිදු කර ඒ වෙනුවට ලදුපතක් හෝ ලබා ගැනීම සිදුකල යුතුය.

3.11 ආයතන සංග්‍රහයේ II වන වෙළුමේ 48 වන පරිච්ඡේදයේ I වන උපලේඛණයේ ඇතුලත් වන වැරදි යටතේ එම වෙළුමේ 24:3 වගන්තියේ සඳහන් වන ප්‍රධාන දඬුවම් හෝ වෙනත් විධිවිධානයක් යටතේ ඊට සමාන දඬුවම් ලබා ඇති නිලධාරීන් සම්බන්ධයෙන් පහත වගන්තිය (3.12) ප්‍රකාරව කටයුතු කල යුතුය.

3.12 ඉහත 3.5, 3.6, 3.7, 3.8, 3.9, 3.10 (iv) සහ 3.11 සම්බන්ධයෙන් අවසන් තීරණය ගැනීම සඳහා අදාල ලේකම්වරයාගේ නිර්දේශය වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යොමුකල යුතුය. එවැනි ඉල්ලීම් ලද විට තවදුරටත් පරීක්ෂා කර බලා තීරණයක් ලබා දීම හෝ අවශ්‍ය අවස්ථාවලදී මෙහි 5.1 වගන්තිය පරිදි කටයුතු කිරීම හෝ කරනු ලැබේ.

## 04. ක්‍රියාපටිපාටිය

4.1 මෙම යෝජනා ක්‍රමය යටතේ බලපත්‍රයක් ලබාගැනීමට සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් පමණක් මෙම චක්‍රලේඛයේ "ඇමුණුම III" යටතේ අයදුම්පත්‍රය මගින් ඉල්ලීමක් ඉදිරිපත් කල යුතු වේ (පරිගණක ගත කිරීමේ පහසුව සඳහා ඉල්ලුම්පත් ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් සම්පූර්ණ කල යුතුය). අයදුම් කරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍රයන්හි ප්‍රකාශිත තොරතුරු නීත්‍යානුකූල ප්‍රකාශ ලෙස සලකනු ලැබේ. එබැවින් අපැහැදිලි අයුරින් තොරතුරු සැපයීම, අයදුම් පත්‍රයේ සම්පූර්ණ කලයුතු කොටස් මගහැරීම සහ සාවද්‍ය තොරතුරු සැපයීම මත බලපත්‍රය ප්‍රමාද වීම හෝ අහිමි වීම පිළිබඳ සම්පූර්ණ වගකීම බලපත්‍ර අයදුම්කරු විසින් දැරිය යුතුය.

4.2 සම්පූර්ණ කරන ලද අයදුම්පත් පහත සඳහන් ලියකියවිලිද සමග අදාල දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත ඉදිරිපත් කල යුතුය.

i. පළමු වරට බලපත්‍රය සඳහා ඉල්ලුම් කිරීමේදී පත්වීම් ලිපියේ හා සේවය ස්ථිර කිරීමේ ලිපිය.

ii. දෙවන වරට බලපත්‍රය සඳහා ඉල්ලුම් කිරීමේදී පළමු වරට බදු සහන යටතේ ලබා ගත් මෝටර් රථය ලියාපදිංචි කල සහතිකය.

iii. අස්ථානගතවූ බලපත්‍රයක් වෙනුවට නව බලපත්‍රයක් අයදුම් කිරීමේදී ඉහත ලිපි ලේඛණයන්ට අමතරව අස්ථාන ගතවූ බවට පොලිස් ස්ථානයක් වෙත කරන ලද පැමිණිල්ලේ පිටපත හා ඒ අනුව අදාල බලපත්‍රය අහෝසි කිරීමේ ලිපියේ පිටපත.

iv. මෙම ලේඛණයන්ට අමතරව අදාල ඉල්ලුම්කරුගේ නිරවද්‍යතාව තහවුරු කර ගැනීම සඳහා සුදුසු බවට අදාල බලපත්‍රය නිකුත් කරනු ලබන බලධාරියා සුදුසු යැයි සිතන ඕනෑම ලියවිල්ලක්.

v. ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් වූ විට මෙම සහන යටතේ කලින් ගෙන්වන ලද වාහන පිළිබඳව තවදුරටත් පරීක්ෂා කිරීම සුදුසු බවට බලපත්‍රය නිකුත් කරනු ලබන නිලධාරියාට හැඟී ගියහොත් ඒ පිළිබඳව ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව සහ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙතින් විමසා සහතික කරගත යුතුවේ.

4.3 බලපත්‍රය නිකුත් කරනු ලබන්නේ බලපත්‍ර ලාභියා විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු පදනම් කරගෙන බැවින්, එම තොරතුරු වල නිරවද්‍යතාවය පිළිබඳව හා ඉදිරිපත් කර ඇති තොරතුරු සාවද්‍ය නොවන බවට තහවුරු කර ගැනීමෙන් පසු පමණක් දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් විසින් අයදුම්පත්‍රය නිර්දේශ කළ යුතු අතර බලපත්‍රය නිකුත් කිරීමට ප්‍රථම බලපත්‍ර නිකුත් කරනු ලබන නිලධාරියාද ඒ පිළිබඳව සෑහීමකට පත්විය යුතුය.

4.4 මෙම යෝජනා ක්‍රමය යටතේ බලපත්‍ර නිකුත් කිරීම සඳහා මෙම චක්‍රලේඛයේ "ඇමුණුම II" මගින් දක්වා ඇති ආයතනවල ලේකම්වරුන් හට මෙයින් බලය ලබා දෙනු ලැබේ. එලෙස නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයකම පිටපත් පහත සඳහන් අයුරින් අදාල ගොනුවලට සහ ආයතන වෙත බලපත්‍රය නිකුත් කරනු ලබන අවස්ථාවේදීම යොමු කල යුතුය.

| | | |
|---|---|---|
| i. | නිලධාරියාගේ පෞද්ගලික ලිපි ගොනුව | |
| ii. | අධ්‍යක්ෂ ජනරාල් | - වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව |
| iii. | අධ්‍යක්ෂ ජනරාල් | - ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව |
| iv. | කොමසාරිස් ජනරාල් | - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව |
| v. | විගණකාධිපති | - විගණකාධිපති දෙපාර්තමේන්තුව |

4.5 මෙම චක්‍රලේඛය යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් මත මෝටර් රථය ලබා ගත් වහාම ඊට අදාල රේගු සටහන්කරයේ (CUSDEC) හෝ දේශීය වශයෙන් මිලදී ගත් විට ලැබෙන ඉන්වොයිසියේ හෝ පිටපතක් බලපත්‍ර ලාභියා විසින් සිය පෞද්ගලික ලිපි ගොනුවට ඇතුලත් කිරීම පිණිස සිය සේවා ස්ථානය වෙත ලබා දිය යුතු අතර එය පෞද්ගලික ලිපි ගොනුවට ඇතුලත් කර ඇති බවට ආයතන ප්‍රධානියා සෑහීමකට පත්විය යුතුය.

05. අනෙකුත් කරුණු

5.1 මෙම යෝජනා ක්‍රමය යටතේ බලපත්‍ර ලබාගැනීමට සුදුසුකම් ලබන තනතුරු හා විධිවිධාන පිළිබඳ අර්ථ නිරූපණ හා අවිනිශ්චිතතාවයන් සම්බන්ධයෙන් ගැටළු ඇති වුවහොත් වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විමසිය යුතු වේ. එවිට අදාල කරුණු පරීක්ෂා කර බලා තීරණයක් ලබා දීම හෝ තව දුරටත් අවශ්‍ය වන්නේ නම් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වරයෙකුගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන කමිටුව වෙත අදාල කරුණ ඉදිරිපත් කර අවසන් තීරණයක් ලබා දීම කරනු ඇත.

5.2 මෙම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව සුදුසුකම් ලබන නිලධාරීන් සඳහා පමණක් බලපත්‍ර නිකුත් කිරීම සෑම ලේකම්වරයෙකුගේම වගකීම වේ.

5.3 මෙසේ ලබා ගන්නා බලපත්‍ර යටතේ පිළිවෙලින් ආනයනය කරනු ලබන හෝ දේශීයව මිලදී ගනු ලබන හෝ වාහන සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුව හෝ දේශීයව අදාල වාහන සපයනු ලබන ආයතන විසින් හෝ පහත සඳහන් තොරතුරු මාසිකව ඊළඟ මාසයේ මුල් සති දෙක තුල වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කල යුතුවේ.

i. බලපත්‍ර අංකය
ii. බලපත්‍ර හිමියාගේ නම, තනතුර, ආයතනය හා අමාත්‍යාංශය
iii. මෝටර් රථයේ වටිනාකම
iv. බදු වටිනාකම පිළිබඳ විස්තර (මුළු, කපා හරින ලද හා ගෙවන ලද)

5.4 මෙම යෝජනා ක්‍රමය යටතේ ලබා ගත් බලපත්‍රය මත ආනයනය කළ හෝ දේශීයව ලබා ගත් වාහනය මුල් ලියාපදිංචි දින සිට වසර පහක් (05) ඉක්ම ගිය පසු බදු ගෙවීමෙන් තොරව අන් අයෙකුට පැවරීමට මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් වරයාට හැකිය.

5.5 මේ යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රවලට අදාලව පැහැදිලි තොරතුරු ක්‍රමවේදයක් පවත්වා ගැනීම සඳහා මෙම යෝජනා ක්‍රමය යටතේ ඉදිරිපත් කල යුතු අයදුම්පත්‍රය සහ නිකුත් කල යුතු බලපත්‍රය අංක කල යුතු ආකාරය "ඇමුණුම I" හි දක්වා ඇත.

5.6 රාජ්‍ය නිලධාරීන්හට තමන් දරන තනතුරු අනුව බදු සහන යටතේ වාහන ලබා ගැනීමට අවස්ථාව සලසා දීම ඔවුන්ට පෞද්ගලික වන සේ ලබා දී ඇති සුවිශේෂී වරප්‍රසාදයකි. නිලධාරියාගේ අවශ්‍යතාව අනුව බලපත්‍ර යටතේ ලබා ගත් මෝටර් රථයක් මෙම චක්‍රලේඛයේ සඳහන් කොන්දේසි උල්ලංඝනය කරමින් අන් අයෙකුට පැවරීම දඬුවම් ලැබිය හැකි වරදකි. ඒ අයුරින් අදාල කොන්දේසි උල්ලංඝනය නොකිරීමට බලපත්‍ර ලාභියා වග බලා ගතයුතු අතර එසේ උල්ලංඝනය වන අවස්ථාවන්හිදී පවත්නා නීති යටතේ ඔවුන්ට විරුද්ධව කටයුතු කෙරෙනු ඇත. තවද, සහනදායී බලපත්‍ර භාවිත කරමින් කිසියම් අක්‍රමිකතාවක් සිදු වුවහොත් එමගින් රජයේ ආදායමට ඇතිවන අහිතකර බලපෑම වලක්වාලමින් මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම මෙම හිමිකම ලබන සියළුම රාජ්‍ය නිලධාරීන් සතු වගකීමකි.

5.7 මෙම කොන්දේසි සහ සහනයන් 2015.11.21 දින සිට ක්‍රියාත්මක කෙරේ.

ආර්.එච්.එස්. සමරතුංග
මහා භාණ්ඩාගාරයේ ලේකම් හා
මුදල් අමාත්‍යාංශයේ ලේකම්

පිටපත් :

| | | |
|---|---|---|
| 01. | විගණකාධිපති | - අ.කා.ස |
| 02. | මහ බැංකුවේ අධිපති | - අ.කා.ස |
| 03. | අධක්ෂ ජනරාල්, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති | - ඉහත පරිදි කටයුතු කිරීම සඳහා |
| 04. | අධක්ෂ ජනරාල්, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති | - අ.කා.ස |
| 05. | අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගු | - අ.කා.ස |
| 06. | අධක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා | - අ.කා.ස |
| 07. | අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර | - අ.කා.ස |
| 08. | කොමසාරිස් ජනරාල්, මෝටර් රථ ප්‍රවාහන | - අ.කා.ස |
| 09. | කොමසාරිස් ජනරාල්, දේශීය ආදායම් | - අ.කා.ස. |
| 10. | අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ විගණන | - අ.කා.ස. |

“ඇමුණුම I”

# අයදූම්පත්‍රය සහ බලපත්‍රය අංක කල යුතු ආකාරය

01. මෙහි “ඇමුණුම III” වශයෙන් ඇති ඉල්ලුම් පත්‍රයේ “අ” කොටසේ සඳහන් අයදූම්පත්‍ර අංකය බලපත්‍රය නිකුත් කරනු ලබන ආයතනය වෙත ඉල්ලුම් පත්‍රය ලැබෙන පිළිවෙලට අංක කරන්න.

02. මෙහි "ඇමුණුම් IV" හි නිකුත් කල යුතු බලපත්‍රයේ ආකෘතිය දැක්වේ. එහි සඳහන් "බලපත්‍ර අංකය (Permit Number)" අදාල බලපත්‍රය නිකුත් කිරීමේදි පහත පරිදි නිවැරදිව අංක කරන්න.

03 . ඉහත සඳහන් “ බලපත්‍ර අංකය” කොටස් හතකින් සමන්විත වේ. එහි 01, 02, 03 සහ 05 කොටස් වල සඳහන් අංක වෙනස් නොකල යුතු අතර අදාල බලපත්‍රය නිකුත් කරනු ලබන ආයතනය මගින් එම අංකයේ 04, 06 සහ 07 වන කොටස් පහත පරිදි සම්පූර්ණ කර බලපත්‍රය නිකුත් කල යුතුය.

i. හතර වන කොටස

මෙහි “ඇමුණුම් II” හි සඳහන් පරිදි තම ආයතනයට අදාල “සංකේත අංකය” ඇතුලත් කරන්න.

*උදා: ලෙස ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිකුත් කරනු ලබන බලපත්‍රවල මෙම සංකේත අංකය “122” වේ.*

ii. හය වන කොටස

බලපත්‍රය නිකුත් කරනු ලබන දිනයට අදාල වර්ෂයේ අවසන් ඉලක්කම් දෙක මෙහි ඇතුලත් විය යුතුය.

*උදා. ලෙස 2016 වර්ෂයේ නිකුත් කරනු ලබන බලපත්‍ර වල මෙම අංකය “16”වේ. 2017 වර්ෂයේදී නම් එම අංකය “17” වේ.*

iii. හත් වන කොටස

අදාල බලපත්‍රය නිකුත් කරනු ලබන පිළිවෙල (ඉල්ලුම් පත්‍රය ලැබෙන පිළිවෙල නොවේ) අනුව ඉලක්කම් හතරකින් යුක්තව සඳහන් කරන්න.

*උදා. ලෙස පළමුව නිකුත් කරනු ලබන බලපත්‍රයේ අංකය “0001” වේ. හත්වන බලපත්‍රය නම් එය “0007” වේ.*

05. කිසියම් හේතුවක් මත “ඇමුණුම් II” හි සඳහන් ආයතන වල නමෙහි වෙනසක් වන්නේ නම් (උදාහරණ ලෙස: අළුතින් අමාත්‍යාංශයක් ඇති කිරීම, දැනට තිබෙන ආයතන 2 ක් හෝ වැඩි ගණනක් එකතු කිරීම වැනි) එවැනි අවස්ථාවකදී බලපත්‍ර නිකුත් කිරීමට ප්‍රථම අදාල ආයතන ප්‍රධානියා / ප්‍රධානීන් විසින් වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලිඛිත ඉල්ලීමක් කර නව "සංකේත අංකයක්" තම ආයතනය වෙනුවෙන් ලබා ගත යුතු වේ. එවැනි ඉල්ලීමක් ලද විට අදාල වෙනස් වීම සලකා බලා සංශෝධිත "සංකේත අංකයක් " හෝ නව "සංකේත අංකයක් " අදාල ආයතනය වෙනුවෙන් ලබා දෙනු ඇත. එවිට එම බලපත්‍ර නිකුත් කල යුත්තේ නව අංකය යොදා ගනිමිනි.

| ශ්‍රී ලංකා රේගුවේ ක්‍රියාත්මක "ආසිකුඩා වර්ල්ඩ්" ක්‍රමයට අදාලව සහනදායී මෝටර් රථ බලපත්‍ර අංකනය කිරීමේදී ඒ ඒ අමාත්‍යාංශයට හා ආයතනයට හිමි වන සංකේත අංකයන් | | |
|---|---|---|
| # පිළිවෙල | ආයතනය/කොමිෂන් සභාව/පළාත් සභාව/අමාත්‍යාංශය | සංකේත අංකය |
| A | Special Institutions - විශේෂ ආයතන | |
| 01 | Presidential Secretariat - ජනාධිපති ලේකම් කාර්යාලය | 001 |
| 02 | Prime Minister's Office - අග්‍රාමාත්‍ය කාර්යාලය | 002 |
| 03 | Office of the Cabinet of Ministers - අමාත්‍ය මණ්ඩල කාර්යාලය | 003 |
| B | Commissions - කොමිෂන් සභා | |
| 01 | Audit Service Commission - විගණන කොමිසම | 021 |
| 02 | Commission of Investigation to Bribery or Corruption - අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම | 022 |
| 03 | Delimitation Commission - සීමා නිර්ණය කොමිසම | 023 |
| 04 | Election Commission - මැතිවරණ කොමිසම | 024 |
| 05 | Finance Commission - මුදල් කොමිසම | 025 |
| 06 | Human Rights Commission of Sri Lanka - මානව හිමිකම් කොමිසම | 026 |
| 07 | National Police Commission - ජාතික පොලිස් කොමිසම | 027 |
| 08 | National Procurement Commission -ජාතික ප්‍රසම්පාදන කොමිසම | 028 |
| 09 | Public Service Commission - රාජ්‍ය සේවා කොමිසම | 029 |
| C | Provincial Councils - පළාත් සභා | |
| 01 | Central - මධ්‍යම | 051 |
| 02 | Eastern - නැගෙනහිර | 052 |
| 03 | North Central - උතුරු මැද | 053 |
| 04 | Northern - උතුරු | 054 |
| 05 | North Western - වයඹ | 055 |
| 06 | Sabaragamuwa - සබරගමුව | 056 |
| 07 | Southern - දකුණු | 057 |
| 08 | Uva - ඌව | 058 |
| 09 | Western - බස්නාහිර | 059 |
| D | Ministries - අමාත්‍යාංශ | |
| 01 | Agriculture - කෘෂිකර්ම | 101 |
| 02 | Buddhasasana - බුද්ධශාසන | 102 |
| 03 | City Planning & Water Supply - නගර සැළසුම් හා ජල සම්පාදන | 103 |
| 04 | Defence - ආරක්ෂක | 104 |
| 05 | Development Strategies & International Trade - සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳාම | 105 |
| 06 | Disaster Management - ආපදා කළමනාකරණ | 106 |
| 07 | Education - අධ්‍යාපන | 107 |
| 08 | Finance - මුදල් | 108 |
| 09 | Fisheries & Aquatic Resources Development - ධීවර හා ජලජ සම්පත් සංවර්ධන | 109 |
| 10 | Foreign Affairs - විදේශ කටයුතු | 110 |
| 11 | Foreign Employment - විදේශ රැකියා | 111 |
| 12 | Health, Nutrition & Indigenous Medicine - සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය | 112 |
| 13 | Higher Education & Highways - උසස් අධ්‍යාපන හා මහාමාර්ග | 113 |
| 14 | Hill Country New Villages, Infrastructure & Community Development - කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන | 114 |

| | | |
|---|---|---|
| 15 | Home Affairs - ස්වදේශ කටයුතු | 115 |
| 16 | Housing & Construction - නිවාස හා ඉදිකිරීම් | 116 |
| 17 | Industry & Commerce - කර්මාන්ත හා වාණිජ කටයුතු | 117 |
| 18 | Internal Affairs, Wayamba Development & Cultural Affairs - අභ්‍යන්තර කටයුතු වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු | 118 |
| 19 | Irrigation & Water Resources Management - වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ | 119 |
| 20 | Justice - අධිකරණ | 120 |
| 21 | Labour & Trade Union Relations - කම්කරු හා වෘත්තීය සමිති සම්බන්ධතා | 121 |
| 22 | Lands - ඉඩම් | 122 |
| 23 | Law & Order and Southern Development - නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන | 123 |
| 24 | Mahaweli Development & Environment - මහවැලි සංවර්ධන හා පරිසර | 124 |
| 25 | Megapolis & Western Development - මහා නගර සහ බස්නාහිර පළාත් සංවර්ධන | 125 |
| 26 | National Co-existence, Dialogue and Official Languages - ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය | 126 |
| 27 | National Integration & Reconciliation - ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන අමාත්‍යාංශය | 127 |
| 28 | National Policies & Economic Affairs - ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු | 128 |
| 29 | Parliamentary Reforms & Mass Media - පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය - | 129 |
| 30 | Petroleum Resources Development - ඛනිජ තෙල් සම්පත් සංවර්ධන | 130 |
| 31 | Plantation Industries - වැවිලි කර්මාන්ත | 131 |
| 32 | Ports & Shipping - වරාය සහ නාවික කටයුතු | 132 |
| 33 | Post, Postal Services & Muslim Religious Affairs - තැපැල්, තැපැල් සේවා සහ මුස්ලිම් ආගමික කටයුතු | 133 |
| 34 | Power & Renewable Energy - විදුලි බල හා පුනර්ජනනීය බලශක්ති | 134 |
| 35 | Primary Industries - ප්‍රාථමික කර්මාන්ත | 135 |
| 36 | Prison Reforms, Rehabilitation, Resettlement & Hindu Religious Affairs - බන්ධනාගාර ප්‍රතිසංස්කරණ නැවත පදිංචිකිරීම්, සහ හින්දු ආගමික කටයුතු | 136 |
| 37 | Provincial Councils & Local Government - පළාත් සභා සහ පළාත් පාලන | 137 |
| 38 | Public Administration & Management - රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ | 138 |
| 39 | Public Enterprise Development - රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන | 139 |
| 40 | Regional Development - ප්‍රාදේශීය සංවර්ධන | 140 |
| 41 | Rural Economic Affairs - ග්‍රාමීය ආර්ථිකය | 141 |
| 42 | Science, Technology & Research - විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ | 142 |
| 43 | Skills Development & Vocational Training - නිපුනතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු | 143 |
| 44 | Social Empowerment and Welfare - සමාජ සවිබලගැන්වීම් සහ සුබසාධන | 144 |
| 45 | Special Assignment - විශේෂ කාර්ය භාර | 145 |
| 46 | Sports - ක්‍රීඩා | 146 |
| 47 | Sustainable Development & Wildlife - තිරසර සංවර්ධන හා වනජීවී | 147 |
| 48 | Telecommunications & Digital Infrastructure - සන්නිවේදන හා ඩිජිටල් යටිතල පහසුකම් | 148 |
| 49 | Tourism Development & Christian Religious Affairs - සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි කටයුතු | 149 |
| 50 | Transport & Civil Aviation - ප්‍රවාහන සහ සිවිල් ගුවන්සේවා | 150 |
| 51 | Women & Child Affairs - කාන්තා සහ ළමා කටයුතු | 151 |

# මෙම අනු පිළිවෙල සකසා ඇත්තේ අංක ලබා දීමේ පහසුව සඳහා පමණි

"ඇමුණුම III"

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2016 යටතේ සහනදායී මෝටර් රථ ආනයන

බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වන අයදුම් පත්‍රය

'අ' කොටස

*බලපත්‍රය නිකුත් කරනු ලබන කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා පමණයි (ඇමුණුම් I අනුව)*

අයදුම්පත්‍ර අංකය

---

( මෙම අයදුම් පත්‍රය සම්පූර්ණ කිරීමට පෙර අදාල චක්‍රලේඛය හොඳින් කියවන්න)

'ආ' කොටස - නිලධාරියා පිළිබඳ පෞද්ගලික විස්තර

01. නම: (ඉංග්‍රීසි කැපිටල් අකුරින් පමණක්) අකුරු හා වචන වෙන් කිරීම සඳහා ඒ අතර කොටුවක් හිස්ව තබන්න

1.1 මුලකුරු සමග නම :

1.2 සම්පූර්ණ නම :

02. ජාතික හැඳුණුම්පත් අංකය :

03. පෞද්ගලික ලිපිනය :

04. පෞද්ගලික දුරකථන අංක :

| ස්ථාවර | | | | | | | | | | ජංගම | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |

05. මීට පෙර ලබා ගත් සහනදායී මෝටර් රථ ආනයන බලපත්‍ර පිළිබඳ විස්තර :

| | දිනය | | මාසය | | වර්ෂය | | | | ලියාපදිංචි කල දිනය |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | | | | | | | | | |
| 2 | | | | | | | | | |

## 'ඇ' කොටස - නිලධාරියාගේ තනතුරු හා සේවා ස්ථාන පිළිබඳ විස්තර

06. තනතුරු හා සේවා ස්ථාන :

6.1 වර්තමාන තනතුර (ඉංග්‍රීසි කැපිටල් අකුරින් පමණක්)

6.2 වර්තමාන තනතුරට පත් වූ දිනය:....................මාසය:...........................වර්ෂය:..............

6.3 වර්තමාන තනතුරේ ශ්‍රේණිය : ------------------------------ හා පන්තිය : ---------------------

6.4 වර්තමාන තනතුරට අයත් වැටුප් කේතය :-----------------------------------------

6.5 වර්තමාන සේවා ස්ථානය:

6.6 සේවා ස්ථානයේ ලිපිනය:

6.7 දුරකථන අංකය හා ෆැක්ස් අංකය:

| දුරකථන | ෆැක්ස් |
|---|---|
| | |

6.8 වර්තමාන සේවා ස්ථානය අයත් අමාත්‍යාංශය / පළාත් සභාව: (ඉංග්‍රීසි කැපිටල් අකුරින් පමණක්)

6.9 මෙම චක්‍රලේඛය යටතේ සුදුසුකම් ලබන තනතුරකට පත් වූ දිනය: ........මාසය:........වර්ෂය:.........

6.10 එම තනතුරේ ස්ථිර කර තිබේද ? : ------------------

6.11 එම තනතුරේ ස්ථිර කර ඇත්නම් ස්ථිර කල දිනය: ........... මාසය:.......වර්ෂය:.........

6.12 සේවා කාලයන් පිළිබඳ විස්තර : (වර්තමාන තනතුරෙන් ආරම්භ කරන්න)

| තනතුර හා සේවා ස්ථානය | සිට | | | දක්වා | | | සම්පූර්ණ කාලය | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | දිනය | මාසය | වර්ෂය | දිනය | මාසය | වර්ෂය | දිනය | මාසය | වර්ෂය |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| එකතුව | | | | | | | | | |

6.13 වැටුප් රහිත සේවා කාලයන් පිළිබඳ විස්තර :

| තනතුර හා සේවා ස්ථානය | සිට | | | දක්වා | | | සම්පූර්ණ කාලය | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | දිනය | මාසය | වර්ෂය | දිනය | මාසය | වර්ෂය | දිනය | මාසය | වර්ෂය |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| එකතුව | | | | | | | | | |

'ඇ' කොටස - කලත්‍රයා සහ පසු අයිතිකරු පිළිබඳ විස්තර

07. කලත්‍රයා/පසු අයිතිකරු පිළිබඳ විස්තර

7.1 කලත්‍රයාගේ සම්පූර්ණ නම :

7.2 කලත්‍රයාගේ ජාතික හැඳුනුම්පත් අංකය :

7.3 අව්වාහක නම් පසු අයිතිකරුගේ සම්පූර්ණ නම :

7.4 පසු අයිතිකරුගේ ජාතික හැඳුනුම්පත් අංකය :

'ඉ' කොටස - අයදුම්කරුගේ ප්‍රකාශය

ඉහත මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනීම පරිදි නිවැරදි හා සත්‍ය බවට සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු හා ලිපි ලේඛණ අසත්‍ය බවට හෝ ඉදිරිපත් කර ඇති තොරතුරු ප්‍රමාණවත් නොවන බවට හෙළි වුවහොත් මාගේ අයදුම් පත්‍රය ප්‍රතික්ෂේප වන බවද, අසත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම මත පවතින නීති රීති යටතේ දඬුවම් ලැබීමට සිදුවන බව ද මා දනිමි. තවද මෝටර් රථය ලබා ගැනීමට පෙර හෝ පසුව මා විසින් සපයා ඇති තොරතුරු අසත්‍ය බව හෙළි වුවහොත් අදාල සහනයන් අහිමි වීමට සහ ලැබූ සහනයන් නැවත රජයට ගෙවීමට හා පවතින නීති යටතේ පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත් වීමට ද එකඟ වෙමි.

.................................................... ....................................................

දිනය අයදුම්කරුගේ අත්සන

'ඊ' කොටස - ආයතන ප්‍රධානියාගේ නිර්දේශය

මගේ අංකය (1)--------------------------------

ලේකම්,

(2) ---------------------------------------------

(3)------------------------------------------------------------- හි (4)-----------------------------------------------
තනතුරෙහි සේවය කරනු ලබන (5)------------------------------------------------------ ගරු ස්වාමීන් වහන්සේ / මහතා/මෙනවිය/මහත්මිය විසින් මෙම (6)-------------------------------------------------------- වෙත (7) ---------------dinැතිව වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2016 යටතේ ඉදිරිපත් කර ඇති අයදුම් පත්‍රය හා ඒ සමග යොමුකර ඇති අනිකුත් ලිපි ලේඛණ පරීක්ෂා කලෙමි.

ඒ අනුව මෙම නිලධාරියා අයදුම් පත්‍රය නිසි පරිදි සම්පූර්ණ කර හා අවශ්‍ය ලිපි ලේඛණ සියල්ල සපයා ඇති බවට සහතික කරමි. එමෙන්ම මෙම නිලධාරියා උක්ත චක්‍රලේඛය යටතේ සුදුසුකම් ලබන තනතුරක ස්ථිර කර ඇති බව සහතික කරමි. සපයා ඇති තොරතුරු අනුව මෙම නිලධාරියා වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2016 හි (8)------------------------ කාණ්ඩය / කාණ්ඩ යටතේ සුදුසුකම් ලබා ඇත. එබැවින් ඉහත (5) ------------------------------------------------- ගරු ස්වාමීන් වහන්සේ / මහතා/මෙනවිය/මහත්මිය හට එකී චක්‍රලේඛය යටතේ සහනදායී මෝටර් රථ බලපත්‍රයක් නිකුත් කිරීම නිර්දේශ කරමි.

---------------------- ..................................................................

දිනය ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

*ඉහත සඳහන් මෙම කොටසේ අංකවලට අදාල විස්තර පහත පරිදි වේ.*
*(1) නිලධාරියා සේවය කරනුලබන ආයතනයේ ලිපිගොනු අංකය, (2) අයදුම්කරු අයත් ආයතනය/කොමිෂන් සභාව/පළාත් සභාව/රේඛීය අමාත්‍යාංශය, (3) අයදුම්කරුගේ වර්තමාන සේවා ස්ථානය, (4) අයදුම්කරුගේ වර්තමාන තනතුර, (5) අයදුම්කරුගේ නම, (6) සහතික කරනු ලබන ආයතන ප්‍රධානියාගේ ආයතනය, (7) අයදුම්පතෙහි දිනය, (8) චක්‍රලේඛයේ 01 වගන්තිය යටතේ සුදුසුකම් ලබන කාණ්ඩය හෝ කාණ්ඩ*

---

"උ" කොටස
ලේකම්වරයාගේ අනුමැතිය

මගේ අංකය ..........................................

ඉහත ඉල්ලුම් පත්‍රය අනුමත කරමි/නොකරමි.

.......................... ..................................................

දිනය ලේකම් ගේ අත්සන හා නිල මුද්‍රාව

"ඇමුණුම IV"

Permit No : | T | 45 | VE | | 001 | | |

........................................
........................................
........................................

Dear Sir,

**IMPORTATION / PURCHASE OF A MOTOR VEHICLE ON CONCESSANORY TERMS UNDER THE TRADE AND INVESTMENT POLICY CIRCULAR NO. 01/2016**

This refers to your application dated ------------------- on the above subject.

Approval is hereby granted to import / purchase locally one unit of motor vehicle in terms of Trade and Investment Policy Circular No. 01/2016 dated ............................, subject to the following conditions;

1. As specified in item No. 3.10(ii) of the said circular, the maximum CIF value should not exceed US $ 30,000/- or its equivalent in any other currency as per the exchange rate that prevailed on the date of opening the Letter of Credit (LC).

2. The officer is liable to pay 50% of total applicable Excise (Special Provisions) duty amount.

3. A vehicle imported or purchased locally should not be transferred to any other party before the completion of five years from the date of first registration of the vehicle.

4. This permit is valid up to the importation of a vehicle or purchase of a locally assembled vehicle.

You are kindly requested to forward this letter along with other relevant documents to the "Director General of Customs" for the purpose of obtaining the duty waiver.

Yours faithfully

........................................
Secretary / Chief Secretary

Cc: 1. Director General of Customs, Sri Lanka Customs.
2. Commissioner General of Motor Traffic, Department of Motor Traffic.
3. Auditor General, Auditor Generals Department
4. Director General, Department of Trade and Investment Policy
5. Manager, ........................................................................ Bank.
6. Personal File of ................................................................................